මගේ අංකය
எனது இல.
My No. DSG/Admin/12/2025

ඔබේ අංකය
உமது இல.
Your No.

තැ.පෙ.අංකය
அஞ்சல் பெ.இ
P.O. Box No. 502

කොළඹ 12.
கொழும்பு 12.
Colombo 12.

# නීතිපති දෙපාර්තමේන්තුව
# சட்டமா அதிபர் திணைக்களம்
# ATTORNEY - GENERAL'S DEPARTMENT

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. 2147888, 2433967, 2320800, 2327919, 2149001(2)

ඉලෙක්ට්‍රොනික් තැපැල
மின் அஞ்சல்
E-mail administration@attorneygeneral.gov.lk

ෆැක්ස්
தொலைநகல்
Fax 2436421

2025.02.07

## මාධ්‍ය නිවේදනයයි

ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 92/2009 නඩුකරයට අදාළව නීතිපතිතුමා විසින් 2025.01.27 දිනැතිව අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අමතා යොමු කොට ඇති ලිපියේ නම් සඳහන් සැකකරුවන් ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් නොවේ.

එම මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශන අවසන් වී නොමැත.

ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් ලබා දී ඇති ප්‍රකාශවල පවතින අන්තර්ගතය, නීතිපතිවරයා වෙත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යොමු කොට ඇති විමර්ශන උධෘත හා නොසැසඳේ.

මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය සිදු වී වසර 06 කුත් ඉක්මවීමෙන් අනතුරුව එනම් 2015 වර්ෂයේ එම මහතා ඝාතනයේ ඇසින් දුටු සාක්ෂිකරුවකු නොවන ඔහුගේ රියදුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නැවත ප්‍රකාශයක් ලබාදෙන අතරවාරයේ දී යම් පිරිසක් විසින් 2009 වර්ෂය අගභාගයේ දී තමා පැහැරගත් බවට දැනුම් දී ඇත.

එම දැනුම් දීම මත විමර්ශනයක් ආරම්භ කරමින් ඒ වන විට ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ කැඳවූ නඩු අංක බී 92/2009 යටතේම කරුණු වාර්තා කිරීමට පියවර ගෙන ඇත.

එකී විමර්ශනයේ දී සැකකරුවකු ලෙස නම් කරන ලද ප්‍රේම ආනන්ද උදලාගම යන අය, ඉදිරිපත් වූ කරුණු අනුව සහ එම හඳුනා ගැනීම සම්බන්ධයෙන් උද්ගත වූ නෛතික දුර්වලතා හේතුකොට ගෙන අපරාධ චෝදනා ගොනු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම මත නිදහස් කිරීමට තීරණය කරන ලදී.

තවද, ලසන්ත වික්‍රමතුංග මහතා ධාවනය කරන ලද වාහනයේ තිබූ ලේඛනයක් අස්ථානගත කිරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විමර්ශනයේ දී අත්අඩංගුවට ගත් පහත නම් සඳහන් සැකකරුවන්;

1. හෙට්ටිආරච්චිගේ දොන් තිස්සසිරි සුගතපාල
2. විතාරණ ආරච්චිගේ සිරිමෙවන් ප්‍රසන්න නානායක්කාර,

අපරාධ චෝදනා ගොනු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම මත නිදහස් කිරීමට ද තීරණය කරන ලදී.

මෙම නිදහස් කිරීම, නව සාක්ෂි හෙළිදරව් වීම මත අපරාධ චෝදනා ගොනු කිරීම සලකා බැලීමට බාධාවක් නොවන බව මෙයින් දන්වා සිටිමි.

ඇන්ජලෝ වැන්හොෆ්,
රජයේ අධිනීතිඥ (පරිපාලන),
නීතිපති වෙනුවට.